**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව - 2022**
**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

  ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව විසින් ආදායමට ගැනීම සඳහා අනුමත කරන ලද වසර 02 ඉක්ම වූ වටිනාකම රු.2,610,512 ක් වූ තැන්පතු ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.362,264 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම් ස්ථාවර තැන්පතු යටතේ ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2022 වර්ෂය තුළ අපහරණය කරන ලද හා වෙන්දේසි කරන ලද වටිනාකම රු.1,171,499 ක් වූ භාණ්ඩ හා වටිනාකම සඳහන් නොවූ අයිතම 18 ක පිරිවැය වත්කම් වලින් ඉවත් කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කරන ලද කර්මාන්තයක් සඳහා ලැබියයුතු ණයගැති ශේෂය රු.100,948 ක් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුළ වැඩ ආරම්භ කර නොමැති කර්මාන්තයක් සඳහා රු.2,000,000 ක් ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි යටතේ ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කරන ලද කර්මාන්ත 04 ක කර්මාන්ත ණයහිමි ශේෂය රු.115,664 කින් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (උ) සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු බිල් කිරීම රු.4,857,766 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | අසමානතාවය සසඳා ඉදිරියේ දී නිවැරදි කරන බව. | - එම - |

| | | |
|---|---|---|
| (ඌ) සමාලෝචිත වර්ෂය සඳහා උසාවි දඩ මුදල් බිල් කිරීම රු.949,834 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.19,112,111 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.1,218,068 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 | 2022 මැයි 09 වන දින නාඳුනන පිරිසක් විසින් සභාවේ රථය ගිනි තබා විනාශ කර තිබූ නමුත්, මු.රෙ.104 පරිදි පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මු.රෙ.104 පරීක්ෂණයක් කිරීමට සභා අනුමැතිය නොලද හෙයින් එම පරීක්ෂණය සිදුකිරීම අනවශ්‍ය බව ලේකම් වෙත වාචිකව දන්වා ඇති බව හා අලාභය රක්ෂණාවරණයෙන් ප්‍රතිපූර්ණය වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2013 අප්‍රේල් 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ IV(අ) කොටස | සභිකයින් 29 දෙනාම ඉන්ධන දීමනාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතු සම්පූර්ණ තොරතුරු සභාව වෙත ඉදිරිපත් කර නොතිබූ නමුත්, ඉන්ධන දීමනාව ලෙස රු.870,000 ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කළයුතු සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් නොකර ඉන්ධන දීමනාව ගෙවීමට කටයුතු නොකරන බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,869,036 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.32,120,727 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,946,500 | 5,105,210 | 4,166,434 | 18,793,338 | 4,824,000 | 4,713,531 | 3,008,396 | 17,854,562 |
| කුලී | 3,109,200 | 4,798,850 | 5,628,046 | 4,025,222 | 3,709,200 | 2,698,250 | 1,924,905 | 4,854,418 |
| බලපත්‍ර ගාස්තු | 716,500 | 1,209,894 | 1,236,244 | 13,550 | 2,251,000 | 992,167 | 970,217 | 39,900 |
| වෙනත් ආදායම් | 7,193,000 | 12,902,697 | 12,994,657 | 848,876 | 6,998,000 | 6,032,962 | 6,032,962 | 940,836 |
| | 16,965,200 | 24,016,651 | 24,025,381 | 23,680,986 | 17,782,200 | 14,436,910 | 11,936,480 | 23,689,716 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට අයවිය යුතු වරිපනම් හා බදු ආදායම රු.17,854,562 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.18,793,338 ක් විය. | 2023.03.21 දින වන විට රු.1,302,768 ක මුදලක් අයකරගෙන ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) සභාවේ වරිපනම් බදු ඒකක 7499 කින් සමාලෝචිත වර්ෂයේ කිසිදු මුදලක් අය වී නොතිබුණු අතර, එම ඒකක වලින් අයවිය යුතු වරිපනම් හිඟ ශේෂය රු.16,981,098 ක් විය. එම ශේෂය තුළ රු.100,000 ට වැඩි ඒකක 05 කින් රු.1,116,218 ක හිඟ ශේෂයක් විය. | මහජනතාව වරිපනම් බදු ගෙවීමේ ප්‍රවණතාවය අඩු වී ඇති බව හා ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට හා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවේ වරිපනම් තක්සේරුවක් වර්ෂ 12 කින් සිදු කර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත දේපල තක්සේරු කිරීම සඳහා එකඟතාවය පළ කර ඇති බව. | තක්සේරුවක් සිදුකර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට අයවිය යුතු කුලී ආදායම රු.4,854,418 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.4,025,222 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා සෑම කාර්තුවක් අවසානයේ ලිපි යොමු කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.4,300,080 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.199,750 ක් ලැබිය යුතුව තිබුණි. | දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ලිපි යොමු කර ඇති බව. | හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ පිහිටි අඩාහැලෙන දිය ඇල්ල පිහිටි භූමිය සභාවට සින්නක්කර ප්‍රදානයකින් ලැබී තිබුණ ද, සංවර්ධනය කර, ආදායම් ඉපයීම සඳහා යොදා ගෙන නොතිබුණි. | සභාවේ ආදායම ඉහළ නංවා ගැනීමට අවධානය යොමු කරමින් පවතින බව. | සභාවට ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කහඳුව ලෙව්වත්තදූව පාර පස් යොදා සංවර්ධනය කිරීම සඳහා අදියර 02 ක් යටතේ රු.899,573 ක් ගෙවීම් කිරීමේ දී සාමාන්‍ය පස් සඳහා වූ ඝණ මීටරයකට රු.1,413 ක් වූ අනුමත මිල අනුපාතය යොදා නොගැනීම නිසා රු.231,903 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී පළාත් මාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලැබෙන සවිස්තරාත්මක වැඩ විස්තරය හා නිශ්චිත මිළ ගණන් අනුව කටයුතු කරන බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගත යුතු වේ. |
| (ආ) | කර්මාන්ත 07 කට අදාළව මාර්ගයේ උස් වූ ස්ථාන සඳහා පස් කැපීමට (Reducing high side soil) මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා වූ මිල ගණන් භාවිතා කර තිබුණ ද, මේ සඳහා ස්කැවේටර් යන්ත්‍ර සහ JCB යන්ත්‍ර භාවිතා කිරීම නිසා ඝණ මීටර් 310.18 ක් සඳහා රු.363,726 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කර්මාන්ත 05 කට අදාළව මාර්ගයේ පැති කාණු වල පස් කැපීම සඳහා මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා වූ මිල අනුපාත භාවිතා කර තිබුණ ද, ඒ සඳහා ස්කැවේටර් යන්ත්‍ර හා JCB යන්ත්‍ර භාවිතා කොට තිබීම නිසා කාණු වල පස් කැපීම සිදු කර තිබීම නිසා ඒ සඳහා රු.137,456 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | කොන්ත්‍රාත්කරු සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව කර්මාන්ත 05 ට අදාළව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු 2022 සැප්තැම්බර් මිල අනුපාත භාවිතා කළයුතු වුවද, එම මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.235,023 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඉදිරියේදී එක් එක් කාර්තුව අනුව පිළියෙල කරන මිළගණන් යටතේ ඇස්තමේන්තු පිළියෙල කර ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරන බව හා ඒ අනුව ගෙවීම සිදු කරන බව. | වැඩිපුර ගෙවීම් කර ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් හා සේවය අත්හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.174,468 ක ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව හා ප්‍රතිචාර නොමැති නම් සභා තීරණ මත කපා හැරීමට කටයුතු කරන බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |